සැකසුම - ඩබ්. ඩී. ශානිකා දිසානායක
ර/පලීගල විද්‍යාලය

## කාර්ය පත්‍රිකාව

- **නිපුණතාව 07 - රසඥතා වර්ධනය සඳහා බහුවිධ සංස්කෘතිකාංග වල වටිනාකම් විචාරයට ලක් කරයි.**
- **නිපුණතා මට්ටම 7.4 - රූපවාහිනිය මගින් ප්‍රචාරය කරන නර්තන වැඩසටහන් පිළිබඳ විචාරය කරයි**
- **පාඩම - රූපවාහිනිය නර්තන වැඩසටහන් විචාරයට ලක් කරමු .**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) අධ්‍යතනයේ ප්‍රචාරය කරන රූපවාහිනිය නර්තන වැඩසටහනක් නොවන්නේ

(i) Little Star
(ii) City Of Dance
(iii) Mega Stars
(iv) Dream Stars

(02) සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමට නර්තන නිර්මාණයකදී සැලකිලිමත් විය යුතු ප්‍රධාන කරුණක් නොවන්නේ

(i) රංග වස්ත්‍රාභරණ පිළිබඳව
(ii) ගායන හා වාදන පිළිබඳව
(iii) ශබ්ද විකාශන යන්ත්‍ර පිළිබඳව
(iv) අංගහාර පිළිබඳව

(03) නර්තන තරග ප්‍රචාරය කිරීමේ මූලික අරමුණක් නොවන්නේ

(i) දක්ෂ ජනප්‍රිය නර්තන ශිල්පියා තේරීම
(ii) විනෝදාස්වාදය සඳහා
(iii) වාණිජ අපේක්ෂාවන් ඉටු කර ගැනීමට
(iv) විදේශීය නර්තනාංග ලංකාව තුළ ව්‍යාප්ත කිරීමට

(04) වර්තමාන රූපවාහිනි නර්තන වැඩසටහන් තුලින් සාම්ප්‍රදායික නර්තනයට සිදුව ඇති හානියක් නොවන්නේ

(i) විචිත්‍ර ඇඳුම් නිර්මාණය
(ii) නොගැලපෙන චලන යොදා ගැනීම
(iii) ගායන නාද මාලාවන් වල වෙනස්කම් සිදුකිරීම
(iv) ශාන්තිකර්ම නර්තන පිළිබඳව විචාරාත්මක වැඩසටහන් විකාශය කිරීම

(05) නර්තනාංග පටිගත කිරීමේදී එම කෘතිවල සාම්ප්‍රදායික ස්වරූපය නිසි ලෙස පිළිබිඹු කිරීමට වඩාත් අවැසි වන්නේ

(i) නර්තන අංග පිළිබඳව අවබෝධය හා පිටපතක් තිබීමයි

(ii) ශාන්තිකර්ම නරඹා තිබීමයි

(iii) ප්‍රේක්ෂකයාගේ ආකල්ප හඳුනාගෙන තිබීමයි

(iv) ප්‍රේක්ෂකයාගේ රුචිකත්වයට වඩා පටිගත කරන්නාගේ රුචිකත්වය අනුව පටිගත කිරීම

**හිස්තැන් පුරවන්න**

(01) නර්තනයේ සාම්ප්‍රදායික අනන්‍යතාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී .................................................................. ............................ ඉතා වැදගත් වේ.

(02) රංගන ශිල්පීන් සම්බන්ධ කර ගනිමින් හිරු නාලිකාවේ ............................................................................ ............ නර්තන තරගාවලිය විකාශනය කරයි.

(03) විචාරකයා සෑම විටම පුළුල් දැක්මකින් හා ............................................................................ තොරව විචාරය කළ යුතුය.

(04) විචාරකයකු තම මත ප්‍රකාශ කළ යුත්තේ තර්කානුකූලව හා ...................................................................... .................................. පදනම් කොට ගෙන ය.

(05) ප්‍රේක්ෂක රස වින්දනය තීව්‍ර කිරීමට රූපවාහිනී ............................................................................ ශිල්ප ක්‍රම ඉවහල් වේ.

## II කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(01) රූපවාහිනි මාධ්‍යයෙන් විකාශය වන නර්තන වැඩසටහන් නම් කරන්න.

(02) දේශීය නර්තන සම්ප්‍රදායවල අනන්‍යතා ලක්ෂණ සුරැකීමට මාධ්‍ය මගින් ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය යෝජනා ඉදිරිපත් කරන්න.

(03) රූපවාහිනියේ දක්නට ලැබෙන නර්තන වැඩසටහන් වල සංස්කෘතික අනන්‍යතා පිළිබඳ විචාරය කරන්න.